## 2003.12.11 දිනැති ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරුවලට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියේ විධිවිධාන අදාළවන ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරීන් සඳහා වන පළමු දෙපාර්තමේන්තු පරීක්ෂණය

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරීන් සඳහා වන 2003 බඳවා ගැනීමේ පටිපාටියට අනුව II පන්තියේ "ආ" ඛණ්ඩයේ සිට II පන්තියේ "අ" ඛණ්ඩයට උසස් කිරීම සඳහා පවත්වනු ලබන පළමු දෙපාර්තමේන්තු පරීක්ෂණය 2023 මාර්තු මස 18,19 යන දෙදින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි පවත්වනු ලැබේ. අපේක්ෂකයන්ට අදාළ විභාග මධ්‍යස්ථානය හා විභාග කාල සටහන ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

**02. විභාගයට පෙනී සිටීමේ සුදුසුකම්**

2003.12.11 දිනැති ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරුවලට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියේ විධිවිධාන අදාළවන මෙම අමාත්‍යාංශය මගින් බඳවා ගන්නා ලද, දැනට ප්‍රාදේශීය ලේකම් කාර්යාල, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සේවයේ නියුතු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සියලුම කාර්මික නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. උක්ත පරීක්ෂණය සඳහා 2003.12.11 දිනැති ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරුවලට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියේ විධිවිධාන අදාළවන විශ්‍රාමික නිලධාරීන්ට ද අයදුම් කළ හැකිය.

*** සටහන - මෙම පරීක්ෂණය සඳහා ඉල්ලුම් කරන දැනටමත් කාර්මික නිලධාරි තනතුරේ Iවන ශ්‍රේණියට හා IIවන ශ්‍රේණියට උසස් වීම් ලබා ඇති නිලධාරීන්ගේ සහ IIIවන ශ්‍රේණියේ නිලධාරීන්ගේ උසස් වීම් දිනය සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් දෙනු ලබන තීරණය අවසන් තීරණය වේ.

**03. භාෂා මාධ්‍යය**

භාෂා මාධ්‍ය විය යුත්තේ නිලධාරියා රජයේ සේවයට ඇතුළුවීමට පෙනී සිටි තරඟ විභාගයේ භාෂා මාධ්‍යයි. අපේක්ෂකයන් තමාට හිමිකම් නොමැති භාෂා මාධ්‍යයකින් විභාගයට පෙනී සිටි බැව් පසුව අනාවරණය වුවහොත් ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

**04. අයදුම්පත් යොමු කිරීම**

මෙම පරීක්ෂණය සඳහා අයදුම්පත් භාර ගැනීම http://apps.moha.gov.lk:8090/to_exam යන සබැඳිය (link) හරහා මාර්ගගත ක්‍රමයට (online) සිදු කරනු ලැබේ. විභාග අයදුම්කරුවන් 2023.03.03 දින හෝ එදිනට පෙර තම අයදුම්පත් යොමු කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**05. විභාගයට ඇතුළත් කර ගැනීම**

පිළිගත් අයදුම්කරුවන් සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ විභාග ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර පෞද්ගලික ලිපි ගොනුව හරහා ආයතන ප්‍රධානියාගෙන් සහතික කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

**06. අනන්‍යතාවය තහවුරු කිරීම**

සෑම අපේක්ෂකයෙක් විසින්ම විභාග ශාලාවේ දී කාර්යය මණ්ඩලයට තම අනන්‍යතාවය තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත ලේඛන පමණක් පිළිගනු ලැබේ.

- ජාතික හැඳුනුම්පත
- වලංගු විදේශ ගමන් බලපත්‍රය
- වලංගු රියදුරු බලපත්‍රය

**07.** විභාගයේ සංයුතිය

| විෂයය අංකය | විෂයය | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | දෙපාර්තමේන්තු රීති හා රෙගුලාසි | පැය 02 | 100 | 40 |
| 02 | තාක්ෂණ I කොටස<br>(ගණිතය, ප්‍රමාණ ගැනීම, සැලසුම් ඇඳීම හා පිටපත් ගැනීම සහ වෛකල්පිත විෂයයන්) | පැය 02 | 100 | 40 |
| 03 | තාක්ෂණ II කොටස<br>(මැනීම හා මට්ටම් ගැනීම ලිඛිත පරීක්ෂණය) | පැය 02 | 100 | 40 |

**08.** විෂයය නිර්දේශය

**8.1.** තාක්ෂණ විෂයයන්

**8.1.1** අනිවාර්යය විෂයයන්

- ගණිතය (පහළ පත්‍රය)
- ප්‍රමාණ ගැනීම (පහළ පත්‍රය)
- මැනීම හා මට්ටම් ගැනීම *
- සැලසුම් ඇඳීම හා පිටපත් ගැනීම.

**8.1.2 වෛකල්පිත විෂයන් (පහත සඳහන් විෂයන්ගෙන් 02ක්)**

- මූලික ගොඩනැගිලි ඉදිකිරීම් හා නඩත්තු
- ජල සම්පාදන හා ජලාපවාහන
- වැඩබිම් පාලනය
- පාරවල් තැනීම හා නඩත්තුව

* මැනීම හා මට්ටම් ගැනීම :-

මෙම විෂයය ලිඛිත පරීක්ෂණය, මිනුම් ප්‍රායෝගික, මට්ටම් ගැනීම ප්‍රායෝගික යනුවෙන් කොටස් තුනකින් යුතු වන අතර ඉහත විෂයයෙන් සාමාර්ථය තීරණය කිරීමේ දී එම කොටස් තුනෙන් සෑම කොටසක් සඳහාම 35% ක අවම ලකුණු ප්‍රමාණයක් ලැබිය යුතු අතර, සම්පූර්ණ විෂයෙන් සමත්වීම සඳහා කොටස් තුනෙන්ම 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

**8.2.** දෙපාර්තමේන්තු රීති හා රෙගුලාසි

මෙම ප්‍රශ්න පත්‍රය දෙපාර්තමේන්තු රීති හා රෙගුලාසි, පනත් ක්‍රියා පිළිවෙත් ආදියට අදාළ ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

සටහන

2003.12.18 දිනැති ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරුවලට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියේ 10:01 (අ) වගන්ති ප්‍රකාරව හා 2006.01.06 දිනැති ශ්‍රී ලංකා තාක්ෂණ සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 8.2 (ඇ) වගන්ති ප්‍රකාරව, එහි සඳහන් නියමිත සුදුසුකම් වලින් එක් සුදුසුකමක් ලබා සිටින නිලධාරීන්ට පළමු දෙපාර්තමේන්තු පරීක්ෂණයේ තාක්ෂණ විෂයන්ගෙන් නිදහස් වීමට අයිතිවාසිකම් ඇත. **එසේ වුවද ඔවුහු දෙපාර්තමේන්තු රීති හා රෙගුලාසි විෂයෙන් සමත් විය යුතුය.**

අනෙකුත් නිලධාරීන් උක්ත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පළමු දෙපාර්තමේන්තු පරීක්ෂණයේ සියලු විෂයන්ට පෙනී සිටිය යුතුය.

**09. ප්‍රායෝගික පරීක්ෂණය**

මෙම දෙපාර්තමේන්තු පරීක්ෂණයේ එක් කොටසක් වන ප්‍රායෝගික පරීක්ෂණය මෙම අමාත්‍යාංශය විසින් ඉදිරියේ දි නම් කරනු ලබන ආයතනයක දි පවත්වනු ලැබේ. මිණුම් ප්‍රායෝගික, මට්ටම් ගැනීම ප්‍රායෝගික යන එක් එක් විෂයය සඳහා ලකුණු 100 ක් බැගින් හිමි වන අතර, විභාගයෙන් සමත්වීම සඳහා එක් කොටසකට අවම වශයෙන් 35% ක් ලබා ගත යුතුය.

ප්‍රායෝගික පරීක්ෂණය පැවැත්වීමට නියමිත ස්ථානය, දිනය හා වේලාව ඇතුළත් ඒ සඳහා වන විභාග ප්‍රවේශ පත්‍රය පසුව නිකුත් කරනු ලැබේ. මේ පිළිබඳ ඉදිරියේ දි ඔබගේ ජංගම දුරකථන අංකයට කෙටි පණිවිඩයක් මගින් දැනුම් දෙනු ලැබේ.

**10. විභාග මධ්‍යස්ථාන**

මෙම විභාගය 2023 මාර්තු මස 18,19 යන දෙදින සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයන්හි දී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත. එක් එක් දිස්ත්‍රික්කය සඳහා අයදුම්කර ඇති අපේක්ෂකයන් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී එවැනි දිස්ත්‍රික්ක කිහිපයක් සඳහා පොදු විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීමට කටයුතු කරනු ඇත.

නීල් බංඩාර හපුහින්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

2023 පෙබරවාරි මස ...23..... වැනි දින
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ දී